## පසුබිම

මිනිස් වෙළඳාමට ගොදුරුවූ පුද්ගලයින් සඳහා සේවා සැපයීම පිළිබඳ ශ්‍රී ලංකාවේ දැනට පවතින තත්වය පරීක්ෂා කිරීමේ දී මෙම ක්‍රියාවලියේ පවත්නා දුර්වලතා සහ මෙම පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ගතයුතු පියවර පිළිබඳව වැදගත් ප්‍රශ්න ගණනාවක් මතු කරනු ලබයි.  මේ සඳහා වෙන්කළ හැකි සම්පත් ප්‍රමාණය සීමාසහිත වන බැවින් මෙහිදී ඉදිරිපත්වන පොදුමතයක් වන්නේ මිනිස් වෙළඳාමට ලක්වූවන්ට ලබාදෙන සේවාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ලක්වූවන් සඳහා ලබාදෙන සේවාවන් සමගින් ඒකාබද්ධ කිරීමයි. ආසියා පදනම මගින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේදී ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ නේපාලය තුළ මිනිස් වෙළඳාමේ වින්දිතයින් හඳුනාගැනීම සහ ඔවුන්ට අදාළ සේවා සැපයීම පිළිබඳ විශ්ලේෂණයක් කිරීමට බලාපොරොත්තු වේ.

මෙම පර්යේෂණයේදී සලකා බලන ලද ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ මිනිස් වෙළඳාමට ලක්වූවන්ට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ලක්වූවන්ට ලබාදෙන සේවාවන් ඒකාබද්ධ කිරීමට හෝ වෙන්කිරීමට ඇති හැකියාව සොයාබැලීමත් එමගින් මිනිස් වෙළඳාමට ලක්වූවන් මෙම සේවාවන් වලට වඩාත් හොඳින් ප්‍රවේශවීම සහතික කිරීමත්ය. ශ්‍රී ලංකාවේ මිනිස් වෙළඳාමට ලක්වූ පුද්ගලයින් උපකාරක සේවා ලබාගැනීමට යාමේදී මුහුණදීමට සිදුවන අභියෝග පිළිබඳව ගුණාත්මක තොරතුරු රාශියක් මෙහිදී එක්රැස් කරගන්නා ලදී. මිනිස් වෙළඳාමට ලක්වූ පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට මුහුණදෙන පුද්ගලයින් අදාළ සේවාවන් ලබාගැනීමේදී ඔවුන් පිළිබඳව දක්වන ආකල්ප වින්දිතයකු මෙම සේවාවන් ලබාගැනීමට උත්සාහ කිරිමේදී විශාල බලපෑමක් ඇතිකරන බවට සඳහන්වී ඇත. මෙම අධ්‍යයනය මගින් වින්දිතයින්ට වඩාත් ඵලදායී සහ අර්ථාන්විත ලෙස සහාය ලබාදිය හැකි ආකාර පිළිබඳව නිර්දේශ සපයනු ලබයි.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී දත්ත එක්රැස් කිරීම සඳහා ගුණාත්මක ප්‍රවේශයක් යොදාගන්නා ලදී. මෙහිදී හඳුනාගත් රජයේ සහ රාජ්‍ය නොවන අංශයේ සේවා සපයන පාර්ශවකරුවන් සමගින් ගැඹුරු සහ ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී. තොරතුරු එක්රැස් කිරීමේදී, භාෂාමය විවිධත්වයක් ඇති, සංක්‍රමණය බහුල මෙන්ම නාගරික, වතු සහ පශ්චාත් යුධසමය පසු කරන දිස්ත්‍රික්ක තෝරා ගනු ලබයි. මීට අමතරව, සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් පවතින ප්‍රදේශ සඳහා ප්‍රමුඛතාවයක් ලබාදෙන ලදී. එම නිසා කොළඹ, මඩකළපුව, යාපනය, මුලතිවු, මාතර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක තෝරාගන්නා ලදී.

## ප්‍රධාන අනාවරණයන්

සේවාවන් වෙත ප්‍රවේශවීමට සහ නීතියේ රැකවරණය ලබාදීම සඳහා පරිපූර්ණ ව්‍යුහයක් සපයන්නාවූ විවිධ වූ ප්‍රතිපත්ති ලේඛන සහ නීතිරාමුවක් ශ්‍රී ලංකාව සතුව ඇත. එනමුත් මිනිස් වෙළඳාමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කරගත් ප්‍රචණ්ඩත්වය වටහා ගනු ලබන ආකාරය මත වින්දිතයින් නිවැරදිව හඳුනාගැනීම අපහසුවී ඇත. සමාජයේ ඇති පිළිගත් මතයන් හා පීතෘමුලික අදහස් නිසා වින්දිතයින් සේවාවන් ලබාගැනීමට ඉදිරිපත් නොවේ. මෙවැනි වින්දිතයෙන් තම ගැටලු ඉදිරිපත් කිරීමේදී දැනට පවත්නා ආයතනිකමය දුර්වලතාවන් දැඩි සීමාකාරී සාධකයන් ලෙස ක්‍රියාකරයි. මෙහිදී හඳුනාගන්නා ලද සමහර ගැටලු පහතින් දක්වා ඇත.

### මිනිස් වෙළඳාමට ලක්වූ තැනැත්තන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ලක්වූවන් පිළිබඳව පවත්නා සීමිත අවබෝධය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේදී මුලික වශයෙන් "ප්‍රචණ්ඩත්වය" ලෙසට ශාරීරික ස්වරූපයෙන් සිදුවන ඒවා පමණක් සැලකීමත් අනෙකුත් ප්‍රචණ්ඩත්ව ස්වරූපයන් නොතකා හැරීමත් දක්නට තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය කාන්තාවන්  විසින් මුහුණ දෙන සංසිද්ධියක් වශයෙන් වටහාගනු ලබන අතර අනෙකුත් සියලුම ලිංගිකත්වයන්ට අයිති පුද්ගලයින්ට අවධානයක් යොමුවන්නේ නැත.

මිනිස් වෙළඳාමට ලක්වන පුද්ගලයින් පිළිබඳව වටහාගැනීම මෙම හඳුනාගැනීමේ ක්‍රියාවලියට සෘජුව

සම්බන්ධවී සිටින නීතිය ක්‍රියාවට නංවන නිළධාරීන් හැරුණුකොට අන්අය අතර පොදුවේ දුර්වල මට්ටමක පවති. මෙවැනි තත්වයකදි පවා ශ්‍රී ලංකාව තුළ සිදුවන මානව කූට්ටනය/මිනිස් ජාවාරම පිළිබඳව සුලු වශයෙන් හෝ කිසිසේත්ම අවධානයක් නොදක්වන තත්වයක් දක්නට ලැබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ මිනිස් වෙළඳාමට ලක්වන පුද්ගලයින් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම සහ හඳුනාගැනීමට සහ වින්දිතයින් සඳහා වූ සේවාවන් වෙත යොමු කිරිමට අවශ්‍ය මානව සහ මූල්‍යමය සම්පත් නොතිබීම මගින් වින්දිතයින් සඳහා පරිපූර්ණ සේවාවන් ලබාදීම වැඩිදියුණු කිරීමට බාධා පමුණුවයි. වින්දිතයින් මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට ඉදිරිපත්වීමේදී බිය සහ ලේබල් වීම පිළිබඳ අවමානය නිසා මෙම තත්වය තවදුරටත් සංකීර්ණ කරනු ලබයි .

### මිනිස් වෙළඳාමට ලක්වූ පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ නීතිමය රාමුව

ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හෝ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සහ පවතින දුර්වලතාවයන්ට විසඳුම් ලබාදීමට නීති සැකසීමට ශ්‍රී ලංකාවට හැකියාවක් පවතින බවට රජය සහ රාජ්‍ය නොවන සංවර්ධන පාර්ශවකරුවන් අතර පොදු එකඟතාවයක් පවතී. නමුත් නීතිය බලාත්මක කිරිම හෝ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ප්‍රශ්න පැන නගී. පොදුවේ යම් දුර්වලතාවයන් පැවැතියත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කරගත් ප්‍රචණ්ඩත්වය සහ මිනිස් වෙළඳාම සම්බන්ධව ඇති නීති මගින් මෙවැනි අපරාධවලට ගොදුරුවන පුද්ගලයින්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයනු ලබයි.

### සේවා සැපයීමේ වැඩසැලැස්ම සහ සේවාවන්ට ප්‍රවේශවීම

ප්‍රචණ්ඩත්වයට ලක්වූවන් සඳහා සේවා සැපයීමට, විශේෂයෙන්ම ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම්කරගත් ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූ අයට සේවා සැපයීමට ශ්‍රී ලංකා රජය සැලකියයුතු මට්ටමේ පියවර රැගෙන තිබේ. රජයේ මහජන සෞඛ්‍ය සහ නීතිය බලාත්මක කිරීමේ ව්‍යුහයන් ශක්තිමත්ව පවතින අතර වෘත්තීමය උපදේශන සේවාවලට යොමුකිරීම් සහ ආර්ථික සහාය ලබාදීම සිදුකර තිබේ.

සංසන්දනාත්මකව බලනවිට වින්දිතයින් සඳහා සේවාවන් සැපයීමේ වැඩසැලැස්මක් දැකගත හැකිවේ. වින්දිතයකු නිවාසයත් වෙත යොමුකළ පසුව සිදුකරන්නාවූ අවශ්‍යතා තක්සේරුවකින් අනතුරුව උපදේශනය, නීතිමය ආධාර, ආර්ථික සහයෝගය යනාදී සියළුම අංශ ඇතුළත්ව අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සියලුම කරුණු කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුවේ.

මෙවැනි මට්ටමක යහපත් සබැඳියාවකින් යුත් ඒකාබද්ධතාවයක් මිනිස් වෙළඳාම් යන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නොමැති අතර වින්දිතයින් පිළිබඳව ප්‍රධාන වගකීම එක් ආයතනයක් මත රඳාපවතින්නේ නැත. එසේම මෙම වින්දිතයින්ට පමණක් විශේෂී වූ සේවාවක් සේවා සපයන ආයතන බහුතරයක් විසින් ලබාදෙන්නේ නැත. තවද, මිනිස් වෙළඳාම ලෙස සැළකෙන්නේ කුමන ක්‍රියාකාරකම්/තත්වයන් අනුවද, යොමු කිරීම් සහ පැමිණිළි ගොනු කරන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් නොමැතිවීම නිසා මෙවැනි වින්දිතයින් හඳුනාගැනීමට සහ ඔවුන්ට සේවාවන් කරා ප්‍රවේශවීමට මහත් දුෂ්කරතා ඇතිකරයි.

## නිර්දේශ

මෙම පර්යේෂණය පදනම් කරගනිමින් දැනට පවත්නා දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි විසඳූම් ලබාදීම සඳහා නිර්දේශ යෝජනා කර තිබේ. මෙම සේවාවන් සැපයීමේදී ඇතිවී තිබෙන දුර්වලතාවයන් බොහොමයකට හේතුවී තිබෙන්නේ මූල්‍යමය සහ මානව සම්පත් වල පවතිනා සීමාකාරී බවය. නිර්දේශ මගින් මෙම දුර්වලතාවයන් පෙන්වා දී ඇති අතර මෙම සේවාවන්හි පවතිනා දුර්වලතා අවම කිරීම සඳහා දැනට සිටින සේවා සපයන්නන් සහ රජයේ වැඩසැලසුම් වඩාත් වැඩි දියුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කර තිබේ.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ සිටින නිලධාරීන්ගේ අවබෝධතා මට්ටම ශක්තිමත් කිරීම.

මෙම නිලධාරීන් පුහුණු කිරිම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කළ යුතුය. අතර ඔවුන්ගේ අවබෝධය වැඩිකිරීම සඳහා හැකි අවස්ථාවන්හිදී මිනිස් වෙළඳාම සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව කරුණු මෙම නිලධාරීන් සඳහා වූ පුහුණු මොඩියුලයන්ට ඇතුළත් කිරීම පිළිබඳව අදාළ

අමාත්‍යාංශය සමගින් උපදේශනාත්මක සාකච්ඡාවන් පැවැත්විය යුතුය.

**ප්‍රාදේශීය මට්ටමේ පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන්ගේ අවබෝධය ශක්තිමත් කිරීම.**

වින්දිතයින් සේවාවන් ලබාගැනීමට පැමිණෙන මූලික ස්ථානයක් ලෙස පොලිස් නිලධාරීන්ට මිනිස් වෙළඳාම හඳුනාගැනීම සඳහා උපකාරී වන මෙවළම් භාවිතා කිරීම සඳහා මාර්ගෝපදේශ ලබාදීම සහ සංවේදී කිරීම වැදගත්වේ. මෙමගින් ශ්‍රී ලංකාව තුල වශයෙන් සිදුවන පුද්ගල ජාවාරම් හඳුනාගැනීම වර්ධනය වීමට ඍජු බලපෑමක් ඇතිකරනු ලබයි

**සෞඛ්‍ය නිලධාරීන් සංවේදී කිරීම**

රජයේ රෝහල්, ශික්ෂණ රෝහල් සහ මූලික රෝහල් වල ක්‍රියාත්මක වන මිතුරු පියස මධ්‍යස්ථානවල උපදේශකවරුන් සහ වෛද්‍ය නිළධාරීන්ට ප්‍රචණ්ඩත්වයේ එක් ස්වරූපයක් ලෙස මිනිස් වෙළඳාම හඳුනාගැනීමට සහාය විය හැකිය. ලිංගික ශ්‍රමිකයින් සහ සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත (LGBTIQ) පුද්ගලයින් වැනි සමාජයේ කොන් කිරීමට පත්වන කණ්ඩායම් සාපේක්ෂ වශයෙන් මහජන සෞඛ්‍ය සේවාවන්ට වඩාත් පහසුවෙන් ප්‍රවේශවීම සිදුවන බැවින් මෙම නිළධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම වැදගත් වේ

**තානාපති කාර්යාලවල නිලධාරීන් පුහුණු කිරීම**

තානාපති කාර්යාල වලට අනුබද්ධව ක්‍රියා කළ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිළධාරීන් ඉවත් කර තිබෙන බැවින් සංක්‍රමණික ශ්‍රමිකයින්, ලිංගික සූරාකෑමට හෝ බලහත්කාරී ලෙස රඳවා සේවය ලබාගැනීමකට හෝ ලක්වූ අවස්ථාවන් වලදී සහාය ලබාදීමට තානාපති කාර්යාලවල නිලධාරීන් පුහුණු කිරීම වැදගත් වේ

**මිනිස් වෙළඳාම් වැළැක්වීමේ ජාතික කාර්යය බලකාය ශක්තිමත් කිරීම**

යොමු කිරීම් සිදුකිරීමේදී සහ මිනිස් වෙළඳාමේ වින්දිතයින් යැයි හඳුනාගන්නා පුද්ගලයින් සේවා වැඩරාමුව තුළ තබාගැනීමට මෙම කාර්ය බලකාය වඩාත් සක්‍රීය අන්දමේ කාර්යභාරයක් සිදුකළ යුතුය. වින්දිතයාගේ මූලික වගකීම් බාරගත හැකි රජයේ ආයතනයකට හෝ කාර්යාලයකට වින්දිතයා යොමුකළ හැකිද යන්න පිළිබඳව එමගින් සැලකිල්ලට ලක් කළ යුතුය. එසේම කාර්යය බලකාය මිනිස් වෙළඳාම් වල වින්දිතයින්ට සේවා සැපයීමේදී සිදුවන දුර්වලතාවන්ට විසඳුම් ලබාදීම සඳහා හඳුනාගත් රාජ්‍ය නොවන ආයතන සමගින් සම්බන්ධවී කටයුතු කළහැකි ආකාරය පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතුයි.

**සේවාවන් සඳහා ප්‍රවේශවීමට එකිනෙක හා ශක්තිමත් බැඳීමකින් යුත් රාමුවක් සැලසුම් කරන්න**

සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් හි පැහැදිලි කර තිබෙන අන්දමට, හඳුනාගත් ආයතන රජය සහ රාජ්‍ය නොවන ආයතන මෙම සේවාරාමුවට ඇතුළත් කළ යුතු අතර නීති, වෛද්‍ය වාර්තාකරණය සහ උපදේශන සේවා සැපයීම සඳහා අවශ්‍ය පුද්ගලයින් පුහුණු කිරීම සහ සංවේදී කිරීම සිදුකළ යුතුය. මෙම සේවාවන්ගෙන් බොහොමයක් රාජ්‍ය සේවාවන් ප්‍රයෝජනවත් වන්නේ මෙම සේවාවන් සැපයීම සඳහා වූ පද්ධතියක් දැනටමත් ක්‍රියාත්මක වෙමින් තිබෙන බැවිනි.

**නිවාරන පියවරයන් සහ ක්‍රියාමාර්ග/ප්‍රයත්නයන් පිළිබඳව අවධානය යොමුකිරීම**

මිනිස් වෙළඳාමට කොවිඩ් 19 වසංගතයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජීය සහ ආර්ථික ගැටලු රැසකට මුහුනදීම හරහා මිනිස් වෙළඳාමට ලක්වීමට ඇති අවධානම වර්ධනය වී ඇත. එම නිසා විශේෂයෙන් ප්‍රජාමට්ටමේ දැනුම්වත්භාවය ඇතිකිරීම ඉතාමත් වැදගත්වේ. ලිංගික ශ්‍රමිකයින්, ගෘහාශ්‍රිත සේවකයින් නියෝජනය කරන වෘත්තීය සංවිධාන, LGBTQ ප්‍රජාවන් නියෝජනය කරනු ලබන සංවිධාන මෙන්ම ආර්ථික කලාපවල සේවකයින්ගේ සංවිධාන කිහිපයක් තෝරාගෙන ඔවුන් සමග සක්‍රීයව මේ සම්බන්ධව කටයුතු කිරීම ඉතා වැදගත්ය.

**දැනටමත් සේවාවන් සපයන්නන් දිරිගැන්වීම**

දැනටමත් ක්‍රියාත්මක වන සේවා සපයන්නන් හරහා මිනිස් වෙළඳාමට ලක්වූ පුද්ගලයින්ට මෙම සේවාවන් ලබාගැනීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ලක්වූවන්ට ලබා දෙන සේවාවන්හි හෝ සම්පත් වල අඩුවීමක් සිදු නොවිය යුතුය. සේවාවන් හා සම්පත් අඩුකිරීමට හේතු නොවිය යුතුයි. එබැවින් මිනිස් වෙළඳාමෙන් වින්දිතයින් බවට පත්වූ පුද්ගලයින්ට උපදේශන සහ නීති උපදෙස් ලබාදීම සඳහා පුහුණු සහ

අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීම මගින් රාජ්‍ය නොවන ආයතන දිරිගැන්විය යුතුවේ.

**රැකවරණ සැපයීම සඳහා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව තක්සේරුවක් සිදුකරන්න.**

මෙම සුරැකුම් මධ්‍යස්ථාන වලින් ලබාදිය යුතු සේවාවන්හි ස්වරූපය කුමක්ද, ආයතනනමය නොවන පරිසරයක් තුළ  මෙම ආරක්ෂාව ලබාදිය හැකිද, අවශ්‍යතාවය අනුව මෙම සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවිය යුතු භූගෝලීය ප්‍රදේශ මොනවාද, මෙවැනි වෙනම පද්ධතියක් ස්ථාපිත කිරීමේදී දැරීමට සිදුවන පිරිවැය සහ මෙම සුරැකුම් මධ්‍යස්ථානයන් ක්‍රියාත්මක විය යුත්තේ කුමන අධිකාරියක් යටතේද පිළිබඳව මෙම අවශ්‍යතා තක්සේරුවේදී අවධානය යොමු කළ හැකියි.

## අධ්‍යයනය පිලිබඳ තොරතුරු

ආසියා පදනම (TAF), එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ මිනිස් වෙළඳාම අධීක්ෂණය සහ තුරන් කිරීමේ කාර්යාලයේ (J/TIP) සහාය ඇතිව මෙම අධ්‍යනය දියත් විය. විවිධ සන්ධර්භයන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කරගත් ප්‍රචණ්ඩත්වයට (GBV) සහ මිනිස් වෙළඳාමේ වින්දිතයින් බවට පත්වන පුද්ගලයින් සොයාගැනීම සහ ඔවුන්ට සහාය සේවා සැපයීම වැඩිදියුණු කිරිම පිළිබඳව රටවල් ගණනාවක ගුණාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. ආසියා පදනම ශ්‍රී ලංකාවේදී මෙම අධ්‍යයනය සිදුකිරීමට දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සංවිධානය සම්බන්ධ කරගන්නා ලදී. මෙම අධ්‍යනයේ ප්‍රධානතම අරමුණ වූයේ ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව යන රටවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් සහ මිනිස් වෙළඳාමේ වින්දිතයින් බවට පත්වන අයට සේවා ලබාදීමේදී ඵලදායී භාවිතාවන් සහ එම සේවාවන් ඒකාබද්ධ කිරීමේදී හෝ වෙන්කිරීමේදී ඇතිවන අභියෝගයන් හඳුනාගැනීමය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයෙන් සහ මිනිස් වෙළඳාමේ වින්දිතයින් බොහෝ අවස්ථාවන්හිදී සමාන සහ එකිනෙක මත ඡේදනය වන්නාවූ අපයෝජනයින් ගෙන් පීඩාවිඳිති. කෙසේවෙතත් සොයා බැලීමේ ක්‍රියාවලියේදී මෙම විවිධ වූ අවදානම් සහගත තත්වයත් බොහෝවිට හඳුනා නොගන්නා බැවින් රැකවරණ සැපයීම ප්‍රමාදවේ. මෙම අධ්‍යයනයේදී  මෙම අන්තර්ඡේදනයන් සහ  එහි ප්‍රතිඵලයන් වශයෙන් වින්දිතයින් හඳුනාගැනීමට සිදුවන බලපෑම,  වින්දිතයින්ට ඵලදායී සේවාවක් සැපයීමේදී අවධානයට ලක්කළ යුතු කරුණු ගවේශණයට කිරීමට සහ මෙම සේවාවන් ඒකාබද්ධ කිරීමට අවශ්‍ය ද යන්න පිළිබඳව ගැඹුරින් අවධානය යොමුකර තිබේ. මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය ගුණාත්මක දත්ත එක්රැස් කිරීම 2020-2021 කාලසීමාවේදී අවසන් කරන ලදී.

*This research was funded  by a grant from the United States Department of State. The opinions, findings and conclusions stated herein are those of the author[s] and do not necessarily reflect those of the United States Department of State.*